# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date } 2024.07.22 |

සී.ඒ.පී.ගුණවර්ධන මිය,

අංක 17, විජයශ්‍රීගම,

රජවැල්ල.

**පැමිණිලිකාරිය**

කේ.ජී.ආර්.එස්.ප්‍රියදර්ශන

**වින්දිත**

**පැමිණිලි අංක - HRC/KND/53/23**

01. ප්‍ර.පො.ප නලින් මයා
    පොලිස් ස්ථානය - තෙල්දෙණිය
02. පො.කො 101299 සඳරුවන්
03. පො.සැ 101306 හේමචන්ද්‍ර
04. පො.කො.රි 103053 චතුරංග
05. පො.කො 96552 මදුමදන්
06. පො.කො 103550 ප්‍රියලාල්
07. පො.කො 45964 සුමිත්
08. පො.කො 1013053 වික්‍රමසිංහ
09. ප්‍ර.පො.ප රිවිරත්න
    පොලිස් ස්ථානය - තෙල්දෙණිය.
10. මු.පො.ප.සේනාධිපති,
    තෙල්දෙණිය.

**වගඋත්තරකරුවන්**

**<u>පැමිණිල්ල</u>**

පැමිණිලිකාර පාර්ශවය විසින් 2023.02.01 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ ඇයගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා වන කේ.ජී.ආර්. එස්.ප්‍රියදර්ශන (වින්දිත) යන අයව 2023.01.27 වන දින ප.ව. 5.30 ට පමණ තෙල්දෙණිය පොලිසියේ

පොලිස් නිලධාරීන් පිරිසක් විසින් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගත් බවට පණිවිඩයක් ලැබුණු බවත්, ඉන්පසු නිලධාරීන් ඔහුට වධහිංසා කරමින් නීති විරෝධි ලෙස 2023.01.29 වෙනි දින දක්වා රඳවාගෙන පසුව සොරකමක් සම්බන්ධයෙන් අධිකරණයට ඉදිරිපත් කළ බවත් පැමිණිලි කරමින් දක්වා ඇත.

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම</u>

2023.01.28 දින පෙ.ව 7.15 ට නිවසක් බිඳ රුපියල් 230,000ක රන් භාණ්ඩ සොරකම් කිරීම පිළිබඳව පැමිණිල්ලක් තෙල්දෙණිය පොලිස් ස්ථානයට ලද බවත්, එම පැමිණිල්ලට අදාළව එදිනම විමර්ශනය ආරම්භ කළ බවත්, 2023.01.28 දින පෞද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලද තොරතුරක් අනුව මෙම සොරකම සම්බන්ධව සැකකරුවන් ගඟ පාරේ පිහිටි නවින් යන අයගේ නිවස ඉදිරිපිට මාර්ගයේ සිටින බවට සිදුකළ දැන්වීම මත නිලධාරීන් එම ස්ථානයට ගොස් සැකකරුවන් 2028.01.28 දින පැය 16.40 ට අත්අඩංගුවට ගත් බවත්, අත්අඩංගුවට ගැනීමට යාමේදී කේ.ජී.ආර්.එස්.ප්‍රියදර්ශන (වින්දිත) යන අය දිවයාමේදී ලිස්සා පැටලී මුනින්අතට වැටුනු බවත්, පසුව සැකකරුවන් රැගෙන පොලිස් ස්ථානයට පැමිණ පැය 19.20ට උපසේවකට භාරදුන් බවත්, පසුදින එනම්, 2023.01.29 වන දින අධිකරණයට ඉදිරිපත් කළ බවටත් කරුණු දක්වා ඇත.

<u>වින්දිතගේ කරුණු දැක්වීම</u>

2023.01.27 වන දින සවස 3.00 ට පමණ තමා, නවින් නැමති අවුරුදු 15 ක පමණ මිතුරෙකු හමුවීමට තමාගේ යතුරුපැදියෙන් ගඟපාර ඩැමේජ් වල අසල තුන්මන් හන්දියට ගිය බවත්, එහි සිටියදී අලු පැහැති මෝටර් රථයක් තම යතුරු පැදිය ඉදිරියේ නවතා සිවිල් ඇඳුමින් සැරසුණු තිදෙනෙකු පැමිණි බවත්,

වාහනය පැදවූ අය තෙල්දෙණිය පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති නලින් ලෙස තමා පසුව හඳුනාගත් බවත්, අනෙක් පුද්ගලයින් දෙදෙනාගෙන් එක් අයෙක් තරමක් සුදු, රැවුල සම්පූර්ණයෙන්ම කැපූ කොණ්ඩය එක් පැත්තකට කොණ්ඩය පීරා සිටි තරමක් මිටි තැනැත්තේකු වන බවත්, ඔහු ඇඹිලිපිටිය ප්‍රදේශයේ අයෙකු බව තමාට පසුව පැවසු බවත්, අනෙක් පුද්ගලයා තරමක් සුදු උස අඩි 6කට ආසන්න උසකින් යුතු උඩු රැවුලක් සහිත තැනැත්තෙකු බවත් ප්‍රකාශ කර ඇත.

පසුව තමා හා තමාගේ මිතුරා වන නවින් එම මොරටර් රථයට දමා ගත් බවත්, ඇඹිලිපිටිය ප්‍රදේශයේ යැයි පැවසු තැනැත්තා තමාට සෙලවීමට නොදී තදින් අල්ලා ගෙන සිටි බවත් "අපි පොලිසියේ. උඹ කෑගහන්න එපා. පාඩුවේ හිටපන්"යැයි ප්‍රකාශ කළ බවත්, නලින් යන අය වාහනය තුලදීම ඔහුගේ වැලමිටින් තමාගේ මුහුණට පහරක් එල්ල කළ බවත්, එහිදි තමාගේ තොල පැලී ලේ වහනය වූ බවත් දක්වා ඇත.

පසුව තමාව තෙල්දෙණිය පොලිස් ස්ථානයට ගෙන ගිය බවත්, එහිදි තමා හඳුනන ප්‍රියන්ත ,රෝහිත සහ අසංක යන අයවලුන් සිටි බවත්,

තමාව පොලිස් ස්ථානයේ සිරමැදිරියට යොමු නොකොට නිලධාරීන් භාවිතා කරන කුඩා කාමර යැයි සිතිය හැකි කාමර කිහිපයක් පවතින ගොඩනැගිල්ලකට තමා ගෙන ගොස් දෑත් පිටුපසට කර මාංචු දමා ඇඳන් දෙකක් අතර ඉන්ද වූ බවත්,

නලින් නැමති පොලිස් නිලධාරියා හා තරමක් සුදු උස අඩි 06කට ආසන්න උඩු රැවුලක් ඇති පොලිස් නිලධාරියෙකු හා ඇඹිලිපිටිය ප්‍රදේශයේ යැයි කියූ නිලධාරියා සිටි බවත්, පසුව එක් අයෙකු තමාගේ යට ඇඳුම් ගලවා නිරුවත් කල බවත්, සිවිල් ඇඳුමින් සිටි තවත් තැනැත්තෙකු නයිමිරිස් ඇති දියරයක් ගෙන ආ බවත්, නලින් නිලධාරියා තමාගේ ලිංගික අවයවයට එම නයි මිරිස් දියරය දැමූ බවත්, තමාගේ දෙපතුල් එක් ඇඳක ඉහලට තබා මුහුණ පොලවට සිටින සේ මුනින් අතට තමා හැරවූ බවත්, ඇඹිලිපිටියේ යැයි පැවසූ නිලධාරියා තමාගේ හිසින් හා උරහිසින් පාගා ගෙන සිටි බවත්, නලින් නැමති නිලධාරියා විසින් දෙකයි දෙකේ රිප්පයකින් තමාගේ යටි පතුල් වලට පහරදුන් බවත්, එම පොල්ල කැඩී තමාගේ පිට දෙපසට වැදුණු බවත් දක්වා ඇත.

එම නිලධාරියා පහර දීම නැවැත්වූ පසුව නැවත තරුණ වයසේ තැනැත්තන් 10 දෙනෙකු පමණ තමා රඳවා සිටි කාමරයට පැමිණි බවත්, ඔවුන් විසින් රිප්ප පටි වලින් සහ ඇල්බිසියා පොලු වලින් දිගින් දිගටම තමාගේ යටි පතුල් වලට පහරදුන් බව වැඩිදුරටත් දක්වා ඇත.

එලෙස පහර දුන් පොලු වලින් කැබලි කිහිපයක් කැඩී තමාගේ මුහුණ දෙසට වැදුනු බවත්, ඔවුන්ගේ පහර දීම නැවතීමෙන් පසු ජලය ඉල්ලා සිටියද ජලය ලබා නොදුන් බවත්, පසුදින සිහිය ලැබෙන විට තමා පොලිස් ස්ථානයේ සිර කුටියක සිටි බවත්, තමාගේ කලිසම අන්දවා තිබූ බවත් දක්වා ඇත.

2023.01.28 දින උදෑසන 7 ට පමණ තමා ඇතුළු සිර මැදිරියේ සිටි සියලුදෙනා තෙල්දෙණිය පොලිස් ස්ථානයේ ආපන ශාලාව අසල වෙනත් ස්ථානයක් වෙත යොමු කල බවත්, පසුව තමාව නැවත පෙ.ව. 9.00 ට පමණ පොලිස් නිලධාරියෙකු වාරු දෙමින් සිරකුටිය වෙත ගෙන ආ බවත්,

එසේම, 2023.01.28 දින උදෑසන 10 ට පමණ තම බිරිඳ තමා බැලීමට සිරමැදිරිය අසලට පැමිණි බවත්, ඇය තමා අපහසුවෙන් ඇවිදින බව දුටු බවත්, ඇය පිටත්ව ගිය පසු ඇඹිලිපිටිය ප්‍රදේශයේ පොලිස් නිලධාරියා තවත් නිලධාරියෙකු සමඟ තමාව සිරමැදිරියෙන් පිටතට ගෙන ගොස් තමාගේ කකුල් වල වූ ඉදිමුම අඩු කිරීමට සිද්ධාලේප ගාමින් කටයුතු කළ බවත් දක්වා ඇත.

තමා සමඟ අත්අඩංගුවට ගත් නවින්ගේ ඥාතීන් ද පොලිස් ස්ථානයේ සිටිනු තමා දුටු බවත්, එදින හවස තමාගේ වැඩිමල් සොහොයුරු තමා බැලීමට පැමිණි බවත්,

2023.01.29 දින ඇඹිලිපිටියේ යැයි පැවසූ නිලධාරියා විසින් " උඹ කොහොම හරි ඇවිදපන් " යැයි පවසා ඔහු විසින්ම සිර මැදිරියට පැමිණ තැඹිලි පැහැති කරලක් තමාගේ ගුද මාර්ගයට ඇතුලත් කල බවත් දක්වා ඇත.

තවද, 2023.01.29 වන දින උදෑසන 8.45ට පමණ තමාගේ නැගණියගේ ස්වාමිපුරුෂයා හා තමාගේ වැඩිමහල් සහෝදරයා තමා බැලීමට පැමිණි බවත්, එදින සවස්වරුවේ තමා විනිසුරුතුමියගේ නිල නිවස වෙත ගෙන ගියබවත්,

තමා නියෝජනය කිරීමට නීතිඥවරයෙකු ඉදිරිපත් වූ නමුත් තමාට ඇප ලබා නොදුන් බැවින් බන්ධනාගාර ගත කළ බවත්, එහිදී තමාව දුම්බර බන්ධනාගාරය වෙත යැවූ බවත්, බන්ධනාගාර නිලධාරීන් හට තමාට පොලිස් නිලධාරීන් විසින් පහර දුන් බවට පැවසුවද, ඒ පිළිබඳව සලකා නොලැබූ බවත්, පසුව තමාව 2023.01.30 වන දින අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව ඇප ලැබුණු බවත්, ඉන්පසු නිවසට යාමෙන් පසුව රෝහල් ගත වී ප්‍රතිකාර ගත් බවත් වැඩිදුරටත් දක්වා සිටියි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වගඋත්තරකාර පාර්ශවය කැඳවා පහත දිනයන්හිදි ප්‍රකාශ සටහන් කර ගෙන ඇත.

පරීක්ෂණ දිනය - 2023.07.06

1. ප්‍ර.පො.ප. රිවිරත්න - 2023.08.15
2. පො.කො 101305 වික්‍රමසිංහ - 2023.08.15
3. පො.කො 1030053 චතුරංග - 2023.08.15
4. පො.කො 45964 සුමිත් - 2023.08.15
5. පො.කො 96552 මධුමදන් - 2023.09.07
6. පො.සැ 101306 හේමචන්ද්‍ර - 2023.09.07
7. පො.කො 103550 ප්‍රියලාල් - 2023.09.07
8. පො.කො 101299 සඳරුවන් - 2023.09.07
9. ප්‍ර.පො.ප නලින් ඉන්දික වැල්ලවත්තගේ - 2023.11.29
10. මූ.පො.ප සේනාධිර - 2024.02.07

__විමර්ශනය__

පැමිණිලිකාර පාර්ශවය විසින් පැමිණිලි කරමින් දක්වා සිටිනුයේ වින්දිතව නීති විරෝධි ලෙස අත්අඩංගුවට ගෙන නීති විරෝධි ලෙස රඳවාගෙන වධහිංසා සිදුකිරීම පිළිබඳවයි.

මුලිකවම අත්අඩංගුවට ගැනීම පිළිබඳව කරුණු විමර්ශනය කිරීමේදී වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටිනුයේ නිවසක් බිඳ රු.230,000ක් වටිනා රන් භාණ්ඩ සොරකම් කිරීම පිළිබඳව 2023.01.28 දිනැතිව ලද පැමිණිල්ලට අදාලව වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගත් බවයි.

වගඋත්තරකාර තෙල්දෙණිය පොලීසිය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද යතුරු ලියනය කරන ලද තොරතුරු පොත්වල සටහන් වල යම් යම් දෝෂ සහගත තත්ත්වයන් පවතින බව නිරීක්ෂණය වූ බැවින් එම මුල් තොරතුරු පොත් කොමිෂන් සභාව වෙත ගෙන්වා පරීක්ෂා කර බලා නිවරදි කරගන්නා ලදී.

එහිදි පොලිස් ස්ථානයට ලද පැමිණිල්ල පිළිබඳව අවධානය යොමු කිරීමේදී 2023.01.28 වන දින පෙ.ව. 7.15 ට ග්‍රාහක අපරාධ තොරතුරු සටහන් පොතේ 191/177 යටතේ රන් භාණ්ඩ සොරකම් කිරීම පිළිබඳ පැමිණිල්ලක් සටහන් කර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ. එම පැමිණිල්ලට අදාලව එම පැමිණිල්ලේ සැකකරු ලෙස රුවන් ශාන්ත (පිරිත් කොටා) සැක බවට පැමිණිල්ලේ සටහන් වී ඇති බව ද අවධානයට ලක්වේ.

එකී පැමිණිල්ලට අදාලව මෙම සොරකම සිදු වී ඇත්තේ 2023.01.23 වන දින බව එම පැමිණිල්ලේ පැමිණිලිකරු දැන ගන්ත ද ඒ පිළිබඳව පොලිස් ස්ථානයට පැමිණිලි කර ඇත්තේ 2027.01.28 වන දින බව නිරීක්ෂණය වේ.

එම පැමිණිල්ලට අදාලවම 2023.01.28 වන දින පෙ.ව.8.00 ට 9 වන වගඋත්තරකරු වන පො.ප. රිවිරත්න ඇතුළු නිලධාරින් ඒ පිළිබඳව විමර්ශනය කිරීමට පිටව ගිය බවට තොරතුරු සටහන් පොතේ 193/178 යටතේ සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව ලද පැමිණිල්ල පෙ.ව. 7.15ට සටහන් කොට විනාඩි 45ක කාලයකදීම, එනම් පෙ.ව. 8.00 ටම ඒ පිළිබඳව අදාළ අපරාධ ස්ථානය පරීක්ෂා කිරීමට හා විමර්ශනය කිරීමට කණ්ඩායමක් ඉතාමත් කඩිනමින් ඒ සඳහා පිටව ගොස් ඇති බවට පිටවීමේ සටහන් 193/178 අනුව අවධානයට ලක්වේ.

එම නිලධාරින් කණ්ඩායමේ පිටවී යාම් හා පැමිණීමෙන් අනතුරුව ප්‍ර.පො.ප. නලින් මහතා ඇතුලු නිලධාරින් සංචාරය සඳහා 2023.01.28 දින පෙ.ව. 11.30ට පිටව ගොස් ඇති බවට තොරතුරු සටහන් 375/263 යටතේ සටහන් වී ඇති අතරම 2023.01.28 පැය 19.20 378/268 සටහන අනුව පැමිණීමේ සටහන යොදා ඇති අතර, පෞද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලද තොරතුරක් මත මෙම සැකකරුවන් ඩැමේජ්වල අසල දී අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව එම කාල සීමාවට අදාලව සැකකරුවන් හා සිද්ධිය පිලිබඳව කිසිඳු විමර්ශනයක් සිදු කර ඇති බවට කිසිඳු ලේඛන සටහනක් ඉදිරිපත් කිරීමට වගඋත්තරකාර පාර්ශවය සමත්ව නැති අතර සොරකමට අදාළ පැමිණිල්ලේ සැකකරු යම් ස්ථානයක සිටින බවට පෞද්ගලික ඔත්තුකරු ලබාදුන් තොරතුර මතම ගොස් අත්අඩංගුවට ගත් බව නිරීක්ෂණය වේ.

ඒ අනුව එක් කණ්ඩායමක් විසින් මූලික විමර්ශනයකින් පසුව එනම්, ස්ථානීය පරීක්ෂණයකින් පසුවත්, තවත් කණ්ඩායමක් විසින් කිසිඳු විමර්ශනයකින් තොරව පැමිණිල්ලේ නම සටහන් වීම මතමත් අත්අඩංගුවට ගෙන ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

තවද, එම සොරකමට අදාළව පැමිණිල්ලේ කිසිඳු නමක් හෝ සඳහන් නොවන නවින් යන අවු 15 ක බාලවයස්කාර දරුවෙකු අත්අඩංගුවට ගෙන ඇති බවට ලේඛන හා වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ අනුව කරුණු නිරීක්ෂණය වන අතරම එම පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට අදාළ කිසිඳු විමර්ශන සටහනක් යොදා නොමැති බව කොමිෂන් සභාවේ අවධානයට යොමු වෙන අතර, එම තැනැත්තා අත්අඩංගුවට ගන්නේ කුමන සාධාරණ හේතුවකට ද පැමිණිල්ලකට ද ඔත්තුවකට ද යන්න පැහැදිලිව හේතු දැක්වීමක් වගඋත්තරකාර පාර්ශවය වෙතින් ඉදිරිපත් වී නොමැති අතරම ඒ පිළිබඳව විභාග සටහන්හි ද ඇතුළත් වී නොමැති බවට නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටිනුයේ සොරකම සිදුකළ බවට සැකපිට වින්දිත හා ඔහුගේ මිතුරා ඩැමේජ්වල අසලදි අත්අඩංගුවට ගත් බවයි. පැමිණිලිකාර පාර්ශවය මෙන්ම වින්දිත පාර්ශවය ද ඔවුන් එම ස්ථානයේදි අත්අඩංගුවට ගත් බවට කරුණු පිළිගනී.

ඒ අනුව මෙම අත්අඩංගුවට ගැනීම සිදුකළ කණ්ඩායම පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයට අනුයුක්තව ස්ථාපිත කළ විමර්ශන ඒකකයේ නිලධාරින් බව නිරීක්ෂණය වන අතර, මෙම විමර්ශනයේදි එම ඒකකය පිහිට වීම සඳහා 2022.09.23 වන දින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි විසින් යොමු කළ ලිපියේ දක්වන අරමුණ කෙරෙහි අවධානය යොමු කිරීමේදී,

"අපරාධ විමර්ශන අංශයට වාර්තා වන පැමිණිල්ලක් ආරම්භයේ සිටම එකම විමර්ශන කණ්ඩායමක් මගින් විමර්ශනය කර එයට අදාලව අධිකරණය ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීම ද එම කණ්ඩායම විසින්ම සිදුකිරීමේදී අදාල විමර්ශනය පිලිබඳව පැහැදිලි අවබෝධයකින් ක්‍රියා කිරීමට ඇති හැකියාව මෙහි අරමුණ වන බව" දක්වා ඇත.

ඒ අනුව එම අරමුණ පිලිබඳ සැලකීමක් නොදක්වා නිසි විමර්ශනයකින් තොරව එක් කණ්ඩායමක් ගොස් සොරකම සිදු වූ ස්ථානය පිලිබඳව මූලික විමර්ශන කිරීමෙන් පසුව කිසිඳු සන්නිවේදනයකින් තොරව අනෙක් කණ්ඩායමට ලද තොරතුරු මත ගොස් මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ. අධිකරණයේදී පැමිණිලිකරු වරද පිලිගැනීම සිදු කළ ද පොලිස් ස්ථානයට ලද අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර අත්අඩංගුවට ගැනීම සිදු කල යුතු වුවද ඒ පිළිබඳ කිසිඳු

විමර්ශනයකින් තොරව නම සඳහන් වීම මතම අතඅඩංගුවට ගැනීම සිදු කර ඇති බවද අවධානයට යොමුවේ.

තවද පැමිණිල්ල සටහන් කල වහාම නිලධාරින් පිටවීමත්, එම සිද්ධිය සිදුවී ඇත්තේ පැමිණිල්ල කිරීමට දින 05 කට පෙර වීමත් මෙහිදි සැලකීමට ලක් කල යුතු කරුණකි.

<u>ගනේෂන් සැම්සන් රෝයි එදිරිව එම්.එම්.ජනක මාරසිංහ ස්ථානාධිපති අපරාධ විමර්ශන දෙපාරතමේන්තුව SCFR 405/2018</u> නඩුවේදී ද දක්වා ඇත්තේ චෝදනාව විශ්වාස කළ හැකි බවට මතයක් ගොඩනගා නොගෙන, ලැබුණු පැමිණිල්ලක් මතම යාන්ත්‍රිකව අත්අඩංගුවට ගැනීමක් පොලිස් නිලධාරින්ට කල නොහැකි බවත්, පැමිණිල්ල විශ්වාස කල හැකිද නැතහොත් ලබා දී ඇති තොරතුරු විශ්වාසදායකද යන්න තහවුරු කර ගැනීමට කරුණු පැහැදිලි නම් මිස අවශ්‍ය විමර්ශන සිදු කිරීමට පොලිස් නිලධාරින් ක්‍රියාත්මක විය යුතු බවයි.

මීලඟට පැමිණිල්ල මගින් කොමිෂන් සභාවට පැමිණිලි කරමින් දක්වා සිටිනුයේ වින්දිත අත්අඩංගුවට ගෙන නීතිවිරෝධී ලෙස රඳවා සිටි බවයි.

වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටිනුයේ මෙම අත්අඩංගුවට ගැනීම සිදුකලේ 2023.01.28 වන දින පැය 16.40ට බවත්, 2023.01.29 වන දින සැකකරු අධිකරණයට ඉදිරිපත් කළ බවත්ය.

එහෙත් වින්දිත තැනැත්තා සහ පැමිණිලිකාර පාර්ශවය දක්වා සිටිනුයේ 2023.01.27 දින අත්අඩංගුවට ගෙන තෙල්දෙණිය පොලිස් ස්ථානයට රැගෙන ගොස් 2023.01.29 දින දක්වා නීතිවිරෝධීව රඳවා ගෙන සිට අධිකරණයට ඉදිරිපත් කළ බවයි.

පැමිණිලිකාර පාර්ශවය 2023.01.27 වන දින වින්දිත තැනැත්තාව අත්අඩංගුවට ගත් බව තහවුරු කිරීම සඳහා කොමිෂන් සභාවට ඇසින් දුටු සාක්ෂි හා අනෙකුත් පරිවේශන සාක්ෂි ඉදිරිපත් කර සිටි.

මෙහිදි ඇසින් දුටු සාක්ෂි ලෙස එම නිතිවිරෝධි රඳවා ගත් කාලය තුළ වින්දිත තැනැත්තා බැලීමට පැමිණි ඔහුගේ බිරිඳ වන ප්‍රියංවදා ගුණවර්ධන, බිරිඳගේ සහෝදරයා වන රාජපක්ෂ මුදියන්සේලාගේ සුමිත් සංජීව රාජපක්ෂ හා වින්දිත තැනැත්තාගේ සහෝදරයා වන ධනංජය සම්පත් ප්‍රියදර්ශන යන අය ඒ පිළිබඳව තහවුරු කරමින් දිවුරුම් ප්‍රකාශ ලබාදී ඇත.

තවද, රාජපක්ෂ මුදියන්සේලාගේ උඩගෙදර හර්ෂ නුවන් බංඩාර යන අයවලුන් ද දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් "තමා 2023.01.28 දින උදෑසන 09ට පමණ උකස් කළ මුදුවක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබාදීමට තෙල්දෙණිය පොලිස් ස්ථානය වෙත ගිය බවත්, එහිදි රුවන් ශාන්ත ප්‍රියදර්ශන සිර මැදිරිය තුළ රඳවා සිටින දුටු බවත්, ඔහු අපහසුතාවයකින් පසු වන බව නිරීක්ෂණය වූ බවත් එම දිවුරුම් ප්‍රකාශයේ දක්වා ඇත.

ලේඛන පරික්ෂා කිරිමේදි 2023.01.29 දින පෙ.ව. 10.30 ට එම හර්ෂ නුවන්ගෙන් ප්‍රකාශයක් ඔහුගේ නිවසේදි සටහන් කළ බවට GCIB 196/184 – පැය 12.40 තොරතුරු සටහන් අලවා ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

එසේම 2023.08.15 දිනැතිව කොමිෂන් සභා පරික්ෂණයේදි අදාළ ලේඛනය වන GCIB ලේඛනය පරික්ෂා කිරීමේදී සටහන් අලවා ඇති බවත්, මුලින් සටහන් කර තිබූ දිනය 2023.01.29 වන දිනය ලෙස වෙනස් කර ඇති බවත්, ප්‍ර.පො.ප රිවිරත්න යන නම ප්‍ර.පො.ප නලින් බවට වෙනස් කර ඇති බවත් නිරීක්ෂණය විය. එම ලේඛනවල සිදුකළ වෙනස් කම තුළින් මුදියන්සේලාගේ උඩගෙදර හර්ෂ නුවන් බංඩාර යන අය ලබා දුන් ඇසින් දුටු සාක්ෂිය සනාථ වේ.

ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් අදාළ සොරකම සම්බන්ධයෙන් ලිඛිත පැමිණිල්ලක් නොමැතිවම, 2023.01.27 වන දින වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගෙන පසුව එනම්, 2023.01.28 වන දින එකී සොරකමට අදාළ පැමිණිල්ල ග්‍රහණ අපරාධ තොරතුරු සටහන් පොතේ 191/177 පැය 7.15ට සටහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

තවද, වින්දිත තැනැත්තා විසින් දක්වා සිටිනුයේ 2023.01.28 වන දින උදෑසන තමා ඇතුලු සිරමැදිරියේ සිටි සියලු දෙනාම ආපනශාලාව අසල වෙනත් ස්ථානයකට යොමුකළ බවත්, පසුව උදෑසන 9.00 ට පමණ නැවත සිරමැදිරියට ගෙනත් දැමු බවත්ය. එසේම, 2023.08.15 දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදි වින්දිත තැනැත්තා විසින් තවදුරටත් දක්වා සිටියේ 2023.01.28 වන දින උදෑසන පොලිස් ස්ථානයේ ඉදිරි කොටස රැස්වීමකට සුදානම් කර තිබූ බවත්, එබැවින් තමා ඇතුලු සිරමැදිරියේ සිටි අය එතනින් ඉවත් කළ බවත් ය.

ඒ අනුව 2023.01.28 වන දින උදෑසන පොලිස් ස්ථානයේ රැස්වීමක් තිබුනාද යන කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමේදි එදින පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන් සඳහා පවත්වන සෙනසුරාදා දින උපදෙස් පන්තිය පවත්වා ඇති බවට දෛනික තොරතුරු සටහන් පොතේ 119/4372 අනුව ලේඛන මගින් තහවුරු වේ.

ඒ අනුව 2023.01.28 වන දින සවස අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානට ගෙන ආවේ නම් 2023.01.28 දින උදෑසන පැවැත් වූ සෙනසුරාදා උපදෙස් පන්තිය පිළිබද අවබෝධයක් හෝ දැනීමක් වින්දිතට තිබිමට නොහැකි බවට කරුනු නිරීක්ෂණය වේ.

2023.01.27 හා 2023.01.28 යන දිනයන්හිදි නිලධාරීන් විසින් යොදා ඇති විමර්ශන සටහන්, පැමිණිමේ සහ පිටවීමේ සටහන්, රාජකාරියට වාර්තා කිරීමේ හා විවේකය වාර්තා කිරීමේ සටහන් පිළිබඳව අවධානය යොමු කිරීමේදි ගැටලු සහගත තත්ත්වයන් හා පරස්පරතාවයන් බොහෝමයක් දක්නට ලැබෙන අතර එතුළින් මෙම අත්අඩංගුවට ගැනීම 2023.01.27 දින සිදුවූ බවට සාක්ෂි සැපයිමක්ද සිදුකරයි.

පැමිණිලිකරුට අනුව 2023.01.27 දින තමා අත්අඩංගුවට ගෙන සිරමැදිරියක නොවන ස්ථානයක රඳවා තමට පහරදුන් බව දක්වා ඇත. ඒ අනුව මෙම අත්අඩංගුවට ගැනීමට සහාය වූවායැයි දක්වන නිලධාරීන් 2023.01.27 වන දින විවේකය වාර්තා කිරිම පිළිබඳ අවධානය යොමු කිරීමේදි පහත දක්වා ඇති වේලාවන්හිදි විවේකය වාර්තා කර ඇති බව ලේඛන අනුව නිරීක්ෂණය වේ.

| | විවේකය වාර්තා කිරිම |
|---|---|
| පො.කො 101299 සඳරුවන් | පැය 06.52 - 2023.01.28 |
| පො.කො 45964 සුමිත් | පැය 23.56 - 2023.01.27 |
| ප්‍ර.පො.ප නලින් බන්ඩාර | පැය 22.05 - 2023.01.27 |
| පො.සැ 101306 හේමචන්ද්‍ර | පැය 06.12 – 2023.01.28 |
| පො.කො.රි 103053 චතුරංග | පැය 22.16 - 2023.01.27 |
| පො.කො 96552 මදුමදන් | පැය 06.42 – 2023.01.28 |

ඒ අනුව අත්අඩංගුවට සහභාගිවූ නිලධාරීන් සියලු දෙනාට 2023.01.27 රාත්‍රි 10 න් පසුව විවේකය වාර්තා කර ඇති අතර, තිදෙනෙක් පසු දින එනම් 2023.01.28 වන දින විවේකය වාර්තා කර ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාවේදී ප්‍රකාශ සටහන් කිරීමේදී ඉහත දැක්වූ ආකාරයට විවේකය වාර්තා කිරීම ප්‍රමාද වීමට විශේෂ රාජකාරියක් තිබුනාද යන්න විමසීමේදී එලෙස විශේෂ රාජකාරියක් නොතිබුණු බවට වගඋත්තරකාර පාර්ශවය විසින් කරුණු දක්වා ඇත. ඒ අනුව 2023.01.27 වන දින අත්අඩංගුවට ගෙන පහරදීම සිදුකිරීම නිසා මෙලෙස විවේකය වාර්තා කිරීම ප්‍රමාද වූවාද යන සාධාරණ පැනය මෙහිදී පැන නගී.

එසේම, 2023.01.28 දිනට අදාළ ලේඛන හා වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රකාශ පිලිබඳ අවධානය යොමු කිරීමේදී 2023.09.07 වන දින පො.කො 103550 ප්‍රියලාල් විසින් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශයක් ලබා දෙමින් 2023.01.28 වන දින උපදෙස් පන්තියට සහභාගි වූ බව ප්‍රකාශ කළ ද, 2023.01.28 දිනැති උපදෙස් පන්තියට සහභාගිවූ නිලධාරීන්ගේ ලේඛනය පරීක්ෂා කිරීමේදී ඔහුගේ නම එහි සටහන් වී නොමැති බවට කරුණු නිරීක්ෂණය වේ.

තවද, පො.කො 101299 සඳරුවන් විසින් 2023.09.07 දින කොමිෂන් සභාව හමුවේ ලබාදුන් ප්‍රකාශයට අනුව 2023.01.28 දින උදෑසන ගංජා පැල වැටලීමක් කළ බවත්, එම වැටලීමෙන් පසු පොලිස් ස්ථානයට පෙ.ව. 11.30 ට පැමිණි බවත් සටහන් වී ඇත. නමුත්, උපදෙස් පන්තියට සහභාගිවූ ලේඛනයේ ඔහුගේ නම ඇතුලත්ව ඇති බව නිරීක්ෂණය වේ.

තවද පොලිස් ස්ථානයට ලද සොරකම සම්බන්ධ පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා පො.ප රිවිරත්න නිලධාරියා, පො.සැ 21071 නිලධාරියා හා පො.කො 45964 නිලධාරියා පිටව ගොස් පෙ.ව. 10.30ට නැවත පොලිස් ස්ථානයට පැමිණි බවට සටහන්ව ඇත. නමුත්, 119/4372 තොරතුරු පොතේ සෙනසුරාදා පෙ.ව. 9ට පැවති උපදෙස් පන්තියට පො.සැ 21071 නිලධාරියා සහභාගී වූ බවට සටහන් වී ඇත. ඒ අනුව පො.සැ 21071 නිලධාරියා එකම වේලාවක උපදෙස් පන්තියේ හා විමර්ශනය සඳහා සහභාගී වී ඇති බව නිරීක්ෂණය වේ.

- තවද පිටවීමේ සටහන්, පැමිණීමේ සටහන් මෙන්ම සේවයට වාර්තා කිරීම්, විවේකය වාර්තා කිරීම් සිදු කළ වේලාවන්ට අදාළ ලේඛන පරීක්ෂා කිරීමේදී ප්‍ර.පො.ප රිවිරත්න නිලධාරියා 2023.01.27 දින පැය 20.00 190/175 යටතේ වරෙන්තු කරුවෙකු වූ ලොරන්ස් සම්පත් හේවගේ නොහොත් හිමාල යන අය අත්අඩංගුවට ගැනීමට ගොස් ස්ථානයට පැමිණි බව ලේඛනවල සටහන් කර ඇත. නමුත් ප්‍ර.පො. රිවිරත්න නිලධාරිගේ පැමිණීමේ හා විවේකය වාර්තා කල වේලාව සැලකීමේදී පෙ.ව 6.30 ට පැමිණීමත් පිටවීම පැය 14.10ටත් සටහන්වී ඇත. එසේ නම් පැය 14.10 ට විවේකය වාර්තා කළ පුද්ගලයා එදින රාත්‍රියේ පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට ගිය බවට සටහන් යොදා තිබීම ප්‍රශ්න සහගත වේ.

- එසේම 2023.01.28 දිනැතිව දූෂණ මර්ධන තොරතුරු සටහන් පොතේ යෙදූ සටහන පරීක්ෂා කිරීමේදී 2023.01.28 පැය 6.30 ට 375/263 යටතේ "ප්‍ර.පො.ප නලින් වන මා පො.කො 45964, 101299, 101305, 95552, 103550 පො.කො.රි 103053 යන නිලධාරීන් සමග අපරාධ සටහන් පොත අත්විලංගු මිනුම් කළමණාකරන සමඟ පිටවීම දක්වා ඇත."

- අංක ඒ 17 දරණ දෙපාර්තමේන්තු නියෝග I වැනි කොටස (4) කොටසේ "ස්ථානයේ කාර්ය භාර නිලධාරියා සහ හෝ ස්ථානයට අයත් වෙනත් පරීක්ෂකයන් හෝ උප පරීක්ෂකයන් දිවා රෑ කොයි වේලාවක වුවද සංචාරයෙහි යෙදෙන විට එය ආරම්භයේදි ද, අවසානයේදි ද පොලිස් ස්ථානයේදි ද තොරතුරු පොතේ සටහනක් ලිවිය යුතුය. සංචාරයේ යෙදෙන බවට සටහනක් ලියනවිට සිටින නැතකට හිදිසියකදි පණිවිඩයක් යවා ගත හැකි වන පරිදි යන එන තැන පිළිබඳව විස්තර එයට ඇතුලත් කළ යුතුය" ලෙස දක්වා ඇත.

- ඒ අනුව ඉහත සටහන අනුව කුමක් සඳහා පිටවීම් කලාද යන්න පිටවීම කලේ කෙසේද හෝ කුමන රථයකින් පිටව ගියාද යන්න පිළිබඳව කිසිදු සටහනක් නොමැති වීමෙන් වගකීම් විරහිතව පො.ප නලින් නිලධාරියා කටයුතු කර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

- තවද 2023.01.28 පැය 19.20ට 378/268 ට පොලිස් දූෂණ මර්ධන තොරතුරු පොත පරීක්ෂා කිරීමේදී "පෙර ඡේද 363 පරිදි පිටව ගිය ප්‍ර.පො.ප නලින් වන මා පො.කො 45964, 101299, 101305, 96552, 103550, පො.කො 103053 නිලධාරින් සමග කරලියද්ද නරගය, මැද මහනුවර, දිගන, අලුත්වත්ත, කොරියාව ප්‍රදේශවල සංචාරය කර නැවත ස්ථානයට පැමිණියා. මා හට ලද තොරතුරකට අනුව බල අපරාධ 10/2023 ට අදාළ නිවසක් බිඳ දේපල සොකරකමට අදාළ සැකකරුවන් 16.30 ට අත්අඩංගුවට ගෙන උපසේවකට භාරදුනිමි" ලෙස දක්වා ඇත.

- එහෙත් වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාවට ලබාදුන් ප්‍රකාශ සැලකිමේදි පො.කො 101299 සදරුවන් නිලධාරි ප.ව. 5.30 -6.30 ට පොලිසියට පැමිණි බවත්, පො.කො. 96552 මධුමදන් ප.ව. 5.30 – 6.00 ට පමණ පොලිසියට පැමිණි බවත්, පො.සැ. 101206 හේමචන්ද්‍ර ප. ව 3.30 හා 3.45 සැකකරු ස්ථානයට රැගෙන ආ බවත් දක්වා ඇත. නමුත් ඉහත යෙදූ සටහන අනුව එය පැය 19.20 ලෙස සටහන් කර ඇත.

- දෙපාර්තමේන්තු නියෝග A-17 හි II කොටස දක්වා ඇත්තේ කෙනෙකු සිරභාරයට ගත් කළ සිරකරු ගෙන එන කොටම හා ඔහු ඉදිරිපිටදිම (ඒ) ඡේද අංකය, (බී) වේලාව, (සී) සිරකරු ගෙන එන කොස්තාපල්ගේ අංකය හා නම සමඟ සිරකරුගේ ලිපි යොමුව ද ඇතුළුව එම කොස්තාපල්ගේ සම්පූර්ණ ප්‍රකාශය, (ඩී) කොස්තාපල් හැර වෙනත් චෝදකයෙක් සිටී නම් එම චෝදකගේ චෝදනාව හෝ ප්‍රකාශය, (ඊ) සිරකරු බීමත්ව හෝ හොඳ සිහියෙන් සිටී ද ආදී වශයෙන් සිරකරුගේ තත්ත්වය හා ඔහුගේ ශරීරයට වූ තුවාල ආදියක ස්වභාවය හා තුවාල වූ තැන්, (එෆ්) සිරකරු ළඟ ඇති දේපල හෝ භාණ්ඩ පිළිබඳ විස්තරය, යන කරුණු එකවරටම පැහැදිලිව සටහන් කර තැබිය යුතුය යන්නයි. එනම්, මෙහිදි වගඋත්තරකාර පාර්ශවයට අනුව පොලිස් ස්ථානයට ගෙන ආ වේලාවන් සැලකීමේදි යම් සැලිකිය යුතු කාලයක් ගිය පසු ස්ථානයට ඉදිරිපත් කළ බවට කරුණු නිරීක්ෂණය වනවා මෙන්ම ප්‍ර.පො.ප යෙදූ වේලාව පිළිබඳ සටහන හා අනිකුත් නිලධාරින් දැක්වූ වේලාව අතර පරස්පරතාවයක් මතුවේ.

- තවද එම අත්අඩංගුවට ගැනීම එනම් (2023.01.28) පිළිබඳ නිලධාරියා යෙදූ සටහන හා අනිකුත් නිලධාරින් ලබාදුන් ප්‍රකාශ පරස්පර වේ.

- ප්‍ර.පො.ප නලින් නිලධාරි යෙදූ සටහනෙහි විවිධ ස්ථානවලට එම කණ්ඩායම පිටව ගිය බවට සටහන් යොදා ඇති නමුත්, පො.කො 101299 2023.09.07 දිනැතිව සිදු කළ ප්‍රකාශයට අදාළව දක්වා ඇත්තේ “2023.01.28 වැටලිමක් කර ගංජා පැල 18ක් විතර ළඟ තිබූ පුද්ගලයෙකු අත්අඩංගුවට ගත්තා. උදේ වැටලීම් රාජකාරියට ගියේ සර්ගේ කාර් එකේ. ඊට පස්සේ ඒ සැකකරු ස්ථානයට ගෙනත්, අපි කාලා මම සර් එක්ක ඉන්නකොට සර්ගේ පුද්ගලික ඔත්තුකරුවෙකු සර්ට තොරතුරක් ආවා අපේ නිලාධාරින් කිපදෙනෙක් එලියේ සිටියා එයාලට පරීක්ෂා කරන්න දුන්නා. එයාලා එම තොරතුරු පරීක්ෂා කරලා කියනකන් අපි පොලිසියේ හිටියා මතක”යි ලෙස දක්වා ඇත.

පො.කො 101306 හේමචන්ද්‍ර නිලධාරි 2023.09.07 ප්‍රකාශය අනුව දක්වා ඇත්තේ,

"2023.01.28 මෙම සැකකරුඅත්අඩංගුවට ගන්න කාර් එකයි බයික් දෙකයි පෙ.ව 11.30 ට පිටත් උනා. අපි 08 දෙනාම පොලිසියෙන් පිටත්වී ඉස්සෙල්ලාම මොරගහමුල්ලට ගියා. ඊට පස්සේ දිගනට ආවා ලෙසය ". ඒ අනුව නිලධාරීන්ගේ පිටවීම පිලිබඳව පරස් පර ප්‍රකාශ මෙහිදි දක්වා ඇත.

තවද, වගඋත්තර පාර්ශවය දක්වන 2023.01.28 උදෑසන වැටලීමෙන් පසු ගංජා පැල ලඟ තබා ගෙන සිටි සැකකරු වන එස්.එම්.පී.සී.ටී.පුංචි බංඩාර පැය 13.15 ට බව අත්අඩංගුවට ගත් බව VIB 378/268 හි සඳහන් කර ඇත.

ඒ අනුව VIB 378/268 සටහන් කළ දූෂණ මර්ධන තොරතුරු සටහන් පොත පරීක්ෂා කිරීමේදි එකි සටහනේ දක්වා ඇත්තේ පෙර ජේදයේ එනම් 2023.01.18 375/263 යටතේ පෙ.ව. 11.30 ට පිටත්ව ගිය නිලධාරීන් වන පො.සැ.101306, පො.කො. 45764, 101299, 101305, 103550, 9552 හා පො.කො.රි 103053 අය සමග කරලියද්ද මැද මහනුවර, බේරුව, ගෝනවල දිගන, අලුත්වත්ත කොරියාව ප්‍රදේශයේ සංචාරය කර ස්ථානයට පැමිණියා. පො.කො 45964 සුමිත් නිලධාරියාට ගංජා වගාවක් සම්බන්ධව ලැබුණු තොරතුරු මත සොයාගොස් පැය 13.15 ට වගාකර තිබු ගංජා පැල සමග මැදමහනුවර පදිංචි සිරිවර්ධන මුදියන්සේලාගේ තිලකරත්න බණ්ඩා අත්අඩංගුවට ගත් අතර, දේපල කුච්තාන්සි 97/23 යටතේ නඩු බඩු ඇතුළත් කර උපසේවක 90415 කරදවල නිලධාරියාට භාර දෙන ලදී. නැවත සංචාරයේ දී මා හට ලද තොරතුරු අනුව බල අපරාධ 10/23 යටතේ අදාළ නිවස බිඳ දේපල සොරා ගැනීමේ වරද කියා දී අත්අඩංගුවට ගන්නා ලදී. පැය 16.40ට 760/18 ගඟ පාර, දිගන, රජවැල්ල හි පදිංචි කෝට්ටේ ආරච්චිගේ නවීන් ප්‍රදීප් යන අය හා කලුගමුවේ රුවන් ශාන්ත පුෂ්පකුමාර යන අය අත්අඩංගුවට ගෙන උපසේවක 90415 කරදවල නිලධාරියා හට භාර දෙමි ලෙස සටහන් වී ඇත.

නිවස බිඳ දේපල සොරා ගැනීමට අදාල සැකකරුවන් දෙදෙනා භාරගත් බවට උපසේවක විසින් සටහන් යොදා ඇති නමුත්, ගංජා පැල ළඟ තබාගත් බවට අත්අඩංගුවට ගත් සැකකරු භාරගත් බවට උපසේවක විසින් සටහන් යොදා නැති බව ලේඛන අනුව තහවුරු වේ.

පො.ප. නලින් නිලධාරියා විසින් ඉහත දක්වා ඇති පරිදි පො.කො. 96552 මදුමදන් ඔහු සමඟ පෙ.ව. 11.30ට පිටත්ව ගොස් පැය 19.20ට පොලිස් ස්ථානයට පැමිණි බවට සටහන් කර ඇති නමුත්, පො.කො. 96552 මදුමදන් විසින් 2023.09.07 වන දින කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ වින්දිත අත්අඩංගුවට ගෙන ප.ව. 5.30 - 6.00 අතර පොලිස් ස්ථානයට පැමිණි බව ය.

එසේවුවද, දූෂණ මර්දන තොරතුරු පොතේ 2023.01.28 වන දින පැය 17.00 ට 377/267 සටහන අනුව MCIB 135/194 අදාළව ත්‍රීරෝද රථයෙන් 104952 නිලධාරියා සහ පො.සැ. 32050 නිලධාරියා සමඟ පො.කො. 96552 මදුමදන් විසින් පිටව ගිය බවට සටහනක් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව මෙම නිලධාරියා වැටලීම් රාජකාරී දෙකක එකම වේලාවක නිරත වී ඇති බව නිරීක්ෂණය වේ.

එසේහෙයින් මෙම සටහන් ව්‍යාජ ලෙස යෙදූ සටහන් ද යන ගැටළුව කොමිෂන් සභාවට ඇති වේ.

මෙම සටහන් යෙදීම ප්‍රශ්න සහගත වන බව අතර වින්දිත අත්අඩංගුවට ගත්දිනය 2023.01.28 දින බව පෙන්වීම සඳහා මෙම සටහන් මෙලෙස නිර්මාණාත්මක ලෙස ලේඛන වල සටහන් කළ බවට සාධාරණ නිගමනයකට එළඹිය හැකි වේ.

නිලධාරින්ගේ සමස්ථ ප්‍රකාශ සැලකීමේදි පිටව ගිය වේලාවන් පිටව ගිය ආකාරය ඇතුලු කරුණු පිළිබඳ පරස්පර ප්‍රකාශ දක්වා ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව සමස්ථ කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේදී 2023.01.27 දින අත්අඩංගුවට ගෙන එම අත්අඩංගුවට ගැනීම 2023.01.28 දින කළ බවට දැක්වීමට ව්‍යාජ සටහන් ලේඛනවල සටහන් කර ඇති බවක් නිරීක්ෂණය වේ.

ඒ අනුව සමස්ථ කරුණු සැලකීමේ දී මෙම වින්දිත අත්අඩංගුවට ගැනීම 2023.01.27 සිදුකර ඇති බවට කරුණු නිරීක්ෂණය වීම මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

මීලගට කොමිෂන් සභාව තම අවධානය යොමු කරනු ලබන්නේ වින්දිත අත්අඩංගුවට ගෙන අමානුෂික හා කෲර වධහිංසාවට ලක්කිරීම පිළිබඳව පැමිණිලිකාර පාර්ශවය දක්වන කරුණු පිළිබඳවයි.

මෙහිදි වින්දිත දක්වා සිටිනුයේ 2023.01.27 දින අත්අඩංගුවට ගැනීමට යන අතරතුරේදි 01 වන වගඋත්තරකරු වැලමිටෙන් වින්දිතගේ මුහුණට පහරක් එල්ල කළ බවත්, එම පහරින් වින්දිතගේ තොල් පැලුනු බවත්, පසුව කාමරයකට ගෙන ගොස් තමා නිරුවත් කර නයි මිරිස් සුවදැති මිශ්‍රනයක් ඔහුගේ ලිංගික අවයවයට දැමූ බවත්, පසුව දෙපතුල් එක ඇදක ඉහලට සිටින සේ නංවා මුහුණ පොලවට සිටින සේ හරවා 01 වන වගඋත්තරකරු දෙකයි දෙකේ රිප්පයකින් තමාගේ යටිපතුල්වලට පහරදුන් බවත්, තමාගේ හිසින් හා උරහිසින්ද නිලධාරීන් දෙදෙනෙක් පාගාගෙන සිටි බවත් පසුව නිලධාරීන් 10 දෙනෙකු පමණ පැමිණ රිප්ප පටිවලින් දිගටම යටිපතුල් වලට පහරදුන් බවත් ය.

තවද, 02 වන වගඋත්තරකරු තමාව මුනින් අතට හරවා එයට සහය පළ කළ බවත්, ඔහු ඇඹිලිපිටිය ප්‍රදේශයේ යැයි පැවසූ නිලධාරියා බවත් වින්දිත තැනැත්තා විසින් ප්‍රකාශ කර ඇත.

එකී 02 වන වගඋත්තරකරු කොමිෂන් සභාව හමුවේ සිය ප්‍රකාශය ලබාදීමේදී ලබා දී ඇති පෞද්ගලික ලිපිනය අනුව ඔහු ඇඹිලිපිටිය ප්‍රදේශයේ බව නිරීක්ෂණය විය.

මිට අදාළව වින්දිත විසින් 2023.01.31 වන දින රෝහල් ගතවීමෙන් පසු අධිකරණ වෛද්‍යවරයා වෙත යොමුවී ඇත. ඒ අනුව අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව කෙරෙහි අවධානය යොමු කිරීමේදී රෝගී ඉතිහාසය ලෙස “රාත්‍රී 8.00 විතර නිරුවත් කරලා තමයි ගැහුවේ Hand Cuff පිටිපස්සට කරලා දාලා පොලුවලින් ගැහුවා නයි මිරිස් අඹරලා මුලු ඇගටම දැම්මා ”ලෙස දක්වා ඇත. ඒ අනුව වෛද්‍ය වාර්තාවේ තුවාල ලෙස,

01. 2cm x 3cm සිරිම් තුවාලය පෘෂ්ය පාර්ශවයේ දකුණු මැණික්කටුවට 4cm දුරින්
02. 1.5 cm x 3 cm රේඛිය සිරිම් තුවාලයක් වම් මැණික් කටුවට 1 cm දුරින් පෘෂ්ටිය පාර්ශවය පිහිටීම
03. 2 cm x 3 cm රේඛිය සිරිම් තුවලයක් පෘෂ්ඨීට පාර්ශවය වම් මැණික් කටුවේ මධ්‍යම රේඛාවට 2cm එහායින්
04. 0.5 cm x 3 cm සිරිම් තුවාලයක් වම් කකුලේ පහත කොටසේ ඉදිරියේ (වම් දණහිස සිට 6 cm පහලින් හා මධ්‍යම රේඛාවට 2 cm එහායින්
05. 1 cm x 3 cm සිරිම් තුවාලයක් වම් කකුලේ පහත කොටසේ ඉදිරිපස (වම් දණහිසේ සිට 8 cm ක් පහලින් හා මධ්‍යම රේඛාවට 3 cm එහායින්)
06. 0.2 cm x 5 cm සිරිම් තුවාලයක් වම් කකුලේ පහත කොටසේ (වම් දණහිසට12 cm පහලින්)
07. 1 cm x 10 cm සිරිම් තුවාලයක් දකුණු පාදයේ පහල ඉදිරි මුහුණතේ ඇතිඅතර, එය දකුණු විලුඹේ සිට 6 cm ක් ඉහලින්
08. 2 cm x 3 cm සිරිම් තුවාලයක් වම් පතුලේ ඉහල බාහිරින් එය වම් විලුඹේ සිට 4 cm දුරින් හා මධ්‍ය රේඛාවට 3 cm ක් දුරින් පිහිටා ඇත.

09. 0.5 cm x 2 cm සිරිම් තුවාලය වම් කකුලේ පහල කොටසේ ඉදිරිපස පිහිටා ඇති අතර, එය වම් විලුඹට 3 cm දුරින් පිහිටා ඇත.

10. 8 cm x 10 cm පමණ වූ මෘදු පටක ඉදිමීමක් වම් කකුලේ ඉහලින් දැකිය හැකි බවත් 2, 4 හා 05 Metatarsal අස්ථි බිඳුමක් ඇති බවට දක්වා ඇත.

තවද අධිකරණ වෛද්‍ය නිලධාරීගේ මතය ලෙස පහත කරුනු දක්වා ඇත.

* 1, 2, 3, 4, 4, 5, 6, 7, 8, 9 බරපතල නොවන තුවාල බවත්
* 10 වෙනි තුවාලය බරපතල තුවාලයක් බවත්
* සියලුම තුවාල මොට බලයකින් සිදුවූ තුවාල බවත්
* 1, 2, 3 තුවාලයෙහි ඉතිහාසයේ දක්වා ඇති පරිදි මාංචු දැමීම යන කාරණය සමග එකග වන බවත්
* 4, 5, 6, 7, 8 හා 9 තුවාලයක ලබාදී ඇති රෝගී ඉතිහාසයේ පොලවට විරුද්ධව තබා ගැනිම මත ඇති වූ තුවාල බවත්
* තුවාල අංක 10 රෝගී ඉතිහාසයේ සඳහන් කර ඇති ලී පොලු මගින් යටි පතුලට සිදුකල පහරදීම මත සිදුවූ තුවාලයක් බවත් එය Falanga නමින් හැඳින්වෙන යටි පතුල්වලට සිදුකළ වධහිංසාවක් බවත්

තවද මිරිස් සහිත වතුර භාවිතා කිරීම පිළිබඳ අධිකරණ මය වශයෙන් සාක්ෂි නොමැති වවුද එම කාරණය බැහැර කිරීම කළ නොහැකි බවට අධිකරණ වෛද්‍ය නිලධාරී තම වාර්තාවේ වැඩිදුරටත් දක්වා ඇත.

එසේම වින්දිත වධහිංසාවට පත් කිරීම හා අවමන් සහගත සැලකීමට ලක්කල බවට රෝගී ඉතිහාස කරුනු ලබාදෙන බවද අධිකරණ වෛද්‍ය නිලධාරී දක්වා ඇත.

ඒ අනුව අධිකරණ වෛද්‍ය වාර්තාව මගින් ප්‍රබල ලෙසට වින්දිත වධහිංසාවට ලක්වූ බවට කරුනු තහවුරු කරයි. තවද වින්දිත මානව හිමිකම් කොමිෂන් සභාවේ දැක්වූ පහරදීම් ආකාරය මෙම තුවාලයත් සමග දැඩිව සැසඳෙන බවට කරුනු නිරීක්ෂණය වේ.

මෙම වින්දිත වධහිංසාවට පත් කිරීමට අදාළව ඇසින් දුටු සාක්ෂි ලෙස ලබාදුන් දිවුරුම් ප්‍රකාශද බැහැර කළ නොහැක. එහිදී වින්දිතගේ බිරිද, බිරිදගේ සහෝදරයා 2023.01.28 දින ඔහු බැලීමට ගියවිට වින්දිත තැනැත්තා අපහසුතාවෙන් සිටි බවටත්, පොලිස් නිලධාරීන් වින්දිතට පහරදුන් බවට වින්දිත පැවසූ බවත් දිවුරුම් ප්‍රකාශ මගින් දක්වා ඇත.

වගඋත්තරකරුවන් සියලු දෙනාම පහරනොදුන් බව කොමිෂන් සභාවේදි ප්‍රකාශ ලබා දීමේදි දක්වා ඇති අතර, අත්අඩංගුවට ගැනිමේදි මෙම වින්දිත දිවයාමේදි ඇද වැටුනු මුනින් අතට ඇද වැටුනු බවත් එම අවස්ථාවේදි සැකකරු අපහසුතාවයෙන් ඇවිද ආ බව දක්වා ඇත.

2023.02.01 දිනැති වැටලිම් තොරතුරු සටහන් පොතේ 20/11 යටතේ විමර්ශන සටහනක් ලෙස 01 වන වගඋත්තරකරු යෙදූ සටහන පිළිබඳ අවධානය යොමු කිරීමේදි සැකකරු කොන්ක්‍රිට් ගැට්වේ ලිස්සා ඇද වැටුනු බවත් ඔහු නොන්ඩි ගසමින් පැමිණි බවට දක්වා ඇත.

ඒ අනුව වගඋත්තරකරුවන් වැටීම නිසා තුවාල සිදුවූ බවට කරුණු තහවුරු කිරීමට තැත්කළ ද එම සිදුවී ඇති තුවාල සියල්ලක්ම මොට ආයුධයකින් සිදුකළ තුවාල බවට වෛද්‍ය මතය දක්වා ඇති බැවින් වගඋත්තරකාර පාර්ශවය දක්වන කරුණු මෙහිදි බැහැර වේ.

මෙම වින්දිත, සැකකරුවෙකු ලෙස තෙල්දෙණිය පොලිස් ස්ථානයේ උපසේවක වෙත භාරදීමේදී යෙද සටහන 2023.01.28 - පැය 19.50 378/268 නිරීක්ෂණය කිරීමේ දී සැකකරුගේ පිටතින් පෙනීමට තුවාල නැති බවට සටහන් යොදා ඇත. ඒ අනුව වගඋත්තරකරුවන් දක්වන ආකාරයට වැටීමේ දී තුවාල වූයේ

නම් ඒ පිළිබඳව විමසා උපසේවක සටහන් යෙදීම කළ යුතු අතර, එම තුවාල උපසේවකට නොපෙනීමට හේතුවක් නොපෙනේ. එලෙස තුවාල තිබුණේ නම් ඔහු එය අනිවාර්යයෙන්ම සටහන් කරන බව ද නිසැක ය.

බන්දුල සමරසේකර එ. විජිත අල්විස් ඕ.අයි.සි ගිනිගත්හේන පොලිස් ස්ථානය (SriLR 213) දක්වා සිටියේ "පොලිස් නිලධාරියෙකුගේ යුතුකම වන්නේ ඔහුගේ උපරිම උත්සහාය සහ හැකියාව සියලු අපරාධ වැරදි හා මහජන පිඩා වැලැක්වීමට සහ වඩාත් වැදගත් ලෙස සාමය ආරක්ෂා කිරිමට භාවිතා කිරිම බවත් ඔහුගේ රාජකාරිය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටු කිරිමට නම් මහජනතාවගේ විශ්වාසය හා ගෞරවයෙන් රඳවා තබා ගත යුතු බවත් මහජනතාවගෙන් එවැනි විශ්වාසයක් හා ගෞරවයක් ලබා ගැනිමට නම් සාමාන්‍ය පුද්ගලයෙකුගෙන් බලාපොරොත්තු වනවාට වඩා උසස් සාදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකමක් පොලිස් නිලධාරියෙකු සතුවිය යුතු බවත්ය.

ඒ අනුව වධහිංසාවෙන් තොර සංස්කෘතියක් බිහි කිරීමට හා මහජන විශ්වාසය ඇතිකර ගැනීම සඳහා පොලිස් නිලධාරින් විසින් විශේෂ කාර්ය භාරයක් තම රාජකාරි ඉටු කිරිමේ කළ යුතු වේ. පෞද්ගලික හේතු දේශපාලන හේතු මත හෝ කිසිදු හේතුවක් මත අත්අඩංගුවට ගන්නා සැකකරුවන් වධහිංසාවට පත්කිරිමට කිසිදු ආකාරයක හැකියාවක් පොලිස් නිලධාරීන්ට නොමැති අතර, වධහිංසාවෙන් මිදීමට ඇති අයිතිය කිසිඳු සීමා කිරිමකට යටත් නොවන අතර, අපරාධයක් කළ බවට පිළිගත් තැනැත්තෙකුට හෝ වධහිංසා සිදුකිරීමට හැකියාවක් නොමැති බවත් දක්වා ඇත.

අමල් සුදත් සිල්වා එ. පො.ප කොඩිතුවක්කු නඩුව මෙන්ම ඩිල්ශාන් තිලකරත්න සහ වයි කුමාරිහාමි එ. සාජන් ඩග්ලස් ඇල්ලේපොල සමග වෙනත් අය (SCFR 578/2011) නඩුවේදි පුද්ගලික නිදහස සහ ආරක්ෂාව පිළිබඳ නිදහස සහ ආරක්ෂාව පිළිබඳව ව්‍යවස්ථාමය සහතිකය භුක්ති විදිමට අයිතිය තිබිය යුතු අතර, සුප්‍රකට හෝ දරුණු අපරාධකරුවන් පවා වධහිංසාවට අමානුෂික හෝ නින්දිත සැලකිමට හෝ දඩුවම් වලට ලක් නොවීමේ අයිතිය අප නීතිය අනුව පවතින බවයි.

වධහිංසාව සිදු කළ බවට වින්දිත තැනැත්තා විසින් 01 වගඋත්තරකරු 2 වන වගඋත්තරකරු පැහැදිලිව හඳුනාගන්නා බැවින්ද, 3,4,5,6 සහ 7 වගඋත්තරකරුවන්ද ඒ වගකීමෙන් බැහැර කිරීමට නොහැකි බැවින් වගඋත්තරකරුගේ සියලු දෙනාම මේ වගකීම් දැරිය යුතු බව නිගමනය කරනු ලැබේ. ඒ අනුව මෙම වින්දිත අත්අඩංගුවේ සිටියදි කෲර අමානුෂික වධහිංසාවට ලක් කිරීම තුළින් ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 11 ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව නිගමනය කරනු ලැබේ.

තවද සැකකරුවකු අත්අඩංගුවට ගැනීම රඳවා තබා ගැනිම පිලිබඳවත්, පොලිස්නිලධාරින්ට ඒ පිළිබඳව වූ වගකිම් සම්බන්ධවත්, ඊට අදාළව නීතිමය ප්‍රතිපාදන පිළිබඳවත් දෙපාර්තමේන්තු නියෝග A-20 මෙන්ම පොලිස්පති චක්‍රලේඛ 2747/2023 මගින් දක්වා තිබියදි ඒ පිළිබඳ නිසි වගකිමක් සහිතව ක්‍රියා නොකර නිතිවිරෝධිව අත්අඩංගුවට ගෙන නිතිවිරෝධිව රඳවා තබාගෙන වධහිංසාවට ලක් කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 12(1) වන ව්‍යවස්ථාවද උල්ලංඝනය කළ බවට කරුණු නිරීක්ෂණය වේ.

තමන් යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේ දැයි අධික්ෂණය කිරීමට උසස් නිලධාරීන්ට යුතු කමක් ඇති බවත්, තම අධික්ෂණයට යටත් වන නිලධාරීන්ගේ හැසිරීම සියුම් ලෙස නිරීක්ෂණය කිරීම ඔවුන්ගේ යුතුකමක් බවත්, යටත් නිලධාරීන් මූලික අයිතිවාසිකම් කඩ කරද්දී ඔවුන්ව වගවීමකට ලක් නොකරන උසස් නිලධාරීන්ද එම මූලික අයිතිවාසිකම් කඩ කිරීමට වගකිව යුතු බවත්, වගවීමකට යටත් නොකිරීම මගින් දණ්ඩ මුක්තියේ පරිසරයක් ඇති කරන බවත්, එවැනි නිලධාරීන්ට විනය පියවර නොගැනීම මගින් නීතිය ඉදිරියේ සමානව සැලකීම උල්ලංඝනය කිරීමක් බවත් තුරෙයිරාජා විනිසුරුතුමා විසින් ආර්.ඒ.ඉරේෂා ලක්මාලි එ. නෙවිල් සිල්වා, කොළඹ අපරාධ කොට්ඨාශය සහ තවත් අය (SCFR/505/19 ) නඩුවේ දී දක්වා ඇත.

10 වන වගඋත්තරකරු වන මූලස්ථාන පොලිස් පරීක්ෂක 2023.01.28 දින දක්වා නිවාඩු සිටියද අදාළ පහර දීම සහ රඳවා ගැනීම 2028.01.27, 28, 29 දිනවලදී සිදු වී ඇති නිසා මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා වෙත ද වගකීම පැවරේ. මෙලෙස නීති විරෝධිව රඳවා තබා ගෙන වධහිංසාවට ලක්කරමින් 2023.01.29 දක්වා රඳවා සිටීම තුළ ආයතන ප්‍රධානියෙකුට ඇති අධීක්ෂණ වගකීම බැහැර නොවේ.

තවද 9 වන වගඋත්තරකරු 2023.01.27 දින මූලස්ථාන පොලිස් පරීක්ෂක ලෙස රාජකාරි ආවරණය කල බැවින් මෙම නීතිවිරෝධිව අත්අඩංගුවට ගැනීම හා වධහිංසාවට ලක් කිරීම පිලිබඳ අධීක්ෂණ වගකීමක් දැරීම හේතුවෙන් වින්දිත පාර්ශවයට සිදු වු හානියට සෘජුවම වගකිවයුතු බව නිරීක්ෂණය වේ.

ඒ අනුව 1,2,3,4,5,6,7,8,9 සහ 10 වන සියලු වගඋත්තරකරුවන් විසින් වින්දිත තැනැත්තා සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12(1) හා 13(2) ව්‍යවස්ථාවන් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරමු.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.**

01. ඒ අනුව 01 සහ 02 වගඋත්තරකරුවන් විසින් එක් අයෙකුගෙන් රු.40,000/-ක් බැගින් රු.80,000/- ක මුදලක් ද, 03, 04, 05, 06, 07, 08, 09 සහ 10 යන වගඋත්තරකරුවන් විසින් එක් අයෙකුගෙන් රු.10,000/- බැගින් රු.80,000/- ක මුදලක් ද වින්දිත පාර්ශවය වෙත ගෙවිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. 1, 2, 3, 4, 5, 6, 7, 8, 9 සහ 10 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිලිබඳව විනය පරීක්ෂණයක් පවත්වා වගඋත්තරකාර පාර්ශවය සම්බන්ධව විනය පියවර ගැනීමට පොලිස්පති වෙත නිර්දේශ කරනු ලැබේ

03. 1994 අංක 24 දරණ වධහිංසාව කෲර අමානුෂික අවමන් සහගත සැලකීම් වැලැක්වීමේ සම්මුති පනත යටතේ නීති කෘත්‍යයක කටයුතු කිරීම සඳහා විශේෂ විමර්ශන අංශය ශ්‍රී ලංකා පොලිසිය මගින් විමර්ශනය කර නිතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස පොලිස්පති වෙත නිර්දේශ කරනු ලැබේ.

04. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(6) වගන්තිය යටතේ මෙම නිර්දේශයේ පිටපතක් විෂය භාර අමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන අතර, කොමිෂන් සභා නිර්දේශය ක්‍රියාත්මක කිරීම පිළිබඳව හා මෙවැනි තත්ත්වයක් තවදුරටත් ඇති වීම වැලැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව පොලිස්පති හා එක්ව කටයුතු කර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කිරීමට හා ශ්‍රී ලංකා පොලිසිය ක්‍රියා කළ යුතු ප්‍රතිපත්තිමය රාමුව පිළිබඳව ආයතන ප්‍රධානීන් වෙත සුදුසු උපදෙස් ලබාදීම සඳහා යොමු කර සිටී.

2024. 08 . 30 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම් දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් : 1. අමාත්‍යතුමා , මහජන ආරක්ෂක අමාත්‍යාංශය,

04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

2. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිසිය.